# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1771/22 - 2012 අගෝස්තු මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2012.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 150/32 (III).

### (404 වන අධිකාරය වූ) දේශීය ණය සහ සංවර්ධන ආඥාපනත

(404 වන අධිකාරය වූ) දේශීය ණය සහ සංවර්ධන ආඥාපනතේ 11 වැනි වගන්තිය යටතේ දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස්වරයන් විසින් සාදනු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියෝගය.

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස්වරයෝ.

2012 ජුනි මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1996 මැයි මස 10 වැනි දින *අංක 922/15 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගය මගින් සංශෝධිත 1996 ජනවාරි මස 10 වැනි දින *අංක 905/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1995 අංක 1 දරන දේශීය ණය සහ සංවර්ධන (විවිධ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 11 වැනි නියෝගයේ (2) වැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(2) කොමසාරිස්වරයන් විසින් 10 වැනි නියෝගයේ (2) වැනි ඡේදයේ සඳහන් ඕනෑම ව්‍යාපෘතියක ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට අසූවක (80%) උපරිමය දක්වා ණය මුදල් ලබා දිය හැකි ය :

එසේ වුව ද,

(අ) රුපියල් මිලියන දෙකක් නොඉක්මවන එවැනි යම් ණය මුදලක්, සභාපතිවරයාගේ නිර්දේශය මත කොමසාරිස්වරයන් විසින් ද ;

(ආ) රුපියල් මිලියන දෙක ඉක්මවන නමුත් රුපියල් මිලියන දහයක් නොඉක්මවන එවැනි යම් ණය මුදලක්, කොමසාරිස්වරයන් විසින් ද ;

(ඇ) රුපියල් මිලියන දහයක් ඉක්මවන එවැනි යම් ණය මුදලක්, අමාත්‍යවරයා විසින් තත් කාර්ය සඳහා බලය දෙන ලද භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයකුගේ නිර්දේශය මත, කොමසාරිවරයන් විසින් ද,

ලබා දිය හැකිය."

(2) එහි 12 වැනි නියෝගයේ, "කොමසාරිස්වරයන් " යන වචනය සඳහා වූ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"සභාපතිවරයා" යන්නෙන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ පත්කළ කොමසාරිස්වරයන්ගේ මණ්ඩලයේ සභාපතිවරයා අදහස් වේ."

08- 881